ශීර්ෂය 300- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 සහ 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව

  ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු කල අගය මත බදු ගිණුම්ගත කිරීමේදී යෙදවුම් මත බදු හා නිමැවුම් මත බදු හිලව් කර ශුද්ධ එකතු කළ අගය මත බද්ද රු.13,807,723 ක් මූල්‍ය වත්කම් යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ යෙදවුම් මත එකතු කළ අගය මත වූ බද්ද රු.34,952,232 ක් පුනරාවර්තන වියදම් යටතේ සහ නිමැවුම් මත එකතු කළ අගය මත බද්ද වූ රු.21,144,509 ක් ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී VAT බදු යෙදවුම් හා නිමවුම් අතර වෙනස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වීමට සටහන් කර ගන්නා ලදි.	එකතු කළ අගය මත බදු වත්කම හෝ වගකීම නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව පැවති රු.332,249 ක ශේෂයක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.	රු. 332,249 ක වෙනස පිළිබඳව පැරණි ලිපිගොනු හා පොත් පරීක්ෂා කර බැලීමේදී 2000 වසරට පෙර සිදු වූ වෙනසක් ලෙස හඳුනාගෙන ඇත.	අත්තිකාරම් බී ගිණුමේ ශේෂ භාණ්ඩාගාර පොත් අනුව ශේෂ සමඟ සැසඳිය යුතුය.
(ii) සේවය අතහැර ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.706,935 ක ණය ශේෂයක් තුල නිලධාරීන් 03 දෙනෙකුගේ රු.366,160 ක ණය ශේෂ වර්ෂ 10 ට වඩා ද නිලධාරීන් 04 දෙනෙකුගේ රු.168,695 ක ශේෂය වසර 20 කට වඩාද පැරණි වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	එක් නිලධාරියකුගෙන් ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිතිපති දෙපාර්තමේන්තුවට දන්වා ඇත. තවත් නිලධාරියකුගේ ණයක් ඔහුගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර ඉතිරි ණය ශේෂ 06 ට අදාළව පෞද්ගලික ලිපිගොනු සොයාගත නොහැකි බැවින් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සඳහා වෙළඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මඟින් කමිටුවක් පත් කර ඇත.	ලැබිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයයන් 11 ක් සඳහා වූ සංශෝධිත අයවැය ප්‍රතිපාදනයන් සියයට 53 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතීමෙන් මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර නොතිබු බව නිරීක්ෂණය විය.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන් 06ක් සඳහා බලාපොරොත්තු වූ වියදම් ඇති නොවූ වැය විෂයන් 05 කින් මු.රෙ 66 අනුව ප්‍රතිපාදන මාරු කිරීම නිසා මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර වෙනස්කම් සිදුව ඇත.	වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා සම්පූර්ණව පිළියෙල කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,132,706 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. තවද වැය විෂයයන් දෙකක් සම්බන්ධයෙන් ඉතිරිය ඉක්මවා රු.460,575 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	මුදල් රෙගුලාසි අංක 115(2) ට අනුව බැරකම් මාර්තු 31 දක්වා ගෙවීම් කිරීමට හැකියාව පවතින බැවින් ඉන් පසු ගිණුම් අංශයට ඉදිරිපත් වී ඇති බැරකම් සහිත වවුචර ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.	සියලුම බැරකම් නිවැරදිව බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දැක්විය යුතුය. ප්‍රතිපාදන ඉතිරිවීම් පිළිබඳව අවධානයෙන් යුතුව බැරකම්වලට එළඹිය යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.4 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.	2022 හා 2023 වර්ෂ වලට අදාල කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	2024 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව ඈවර කිරීමට තීරණය කර තිබූ හෙයින් මෙම තනතුර ඇති කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබූ නමුත් තනතුර අනුමත කරගෙන ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදී.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙක් පත් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.4, 4.2.5 හා 4.4 වගන්ති	303,749	විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 10 ඉක්ම වූ රු.149,619 ක ආපදා ණය ශේෂයක් පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ	විශ්‍රාම වැටුප් ලබාගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ණය ශේෂ අය කර ගැනීමේ හැකියාව පිළිබඳව 2025	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ

	පාරිතෝෂිත මුදල්වලින් හෝ මාසික විශ්‍රාම වැටුප හා අදාළ දීමනාවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 10 ඉක්ම වූ රු.154,130 ක් වූ ණය ශේෂය ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩුකරගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා නොතිබුණි.	ජනවාරි 24 දිනැතිව ලිපි යවා ඇත. මියගිය නිලධාරියාගේ ණය ශේෂය අය කර ගැනීමේ හැකියාව පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත 2025 මාර්තු 20 දිනැතිව ලිපියක් යොමු කර ඇත.	යුතුය.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මුදල් රෙගුලාසි 110	දෙපාර්තමේන්තුව විසින් හානි හා පාඩු ලේඛනයක් විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.	හානිපාඩු ලේඛනයක් පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.	හානි හා පාඩු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ii) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6)	2023 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මාස 5 ක් පමණ ප්‍රමාද වී තිබුණි. තවද 2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2025 අප්‍රේල් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනමින් සිදුකර අවසන් කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(iii) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 මගින් සංශෝධිත මු.රෙ 113 (6) (ආ)	365,547	වැඩ තහනම් කර ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 20 කට වඩා පැරණි හා වර්ෂ 03 සිට වර්ෂ 20 දක්වා කාලයක් පැරණි එකතුව රු.365,547 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂ 06 හි පෞද්ගලික ලිපිගොනු සොයා ගත නොහැකි බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 හි අන්තර්කාලීන විධිවිධාන අනුව 04(i) හි සීමාවන් යටතේ කටයුතු කළ හැකි ණය ශේෂයන් ලෙස අත්හැර දැමීම සුදුසු බව කමිටුවක් මඟින් නිර්දේශ කරන ලදි. නමුත් ලිපි ගොනු විනාශ වීම ණය අතහැර දැමීම සඳහා හේතුවක් ලෙස පිළිගත නොහැකි බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුම් දී ඇත. ඒ අනුව ණය කපාහැරීමේ හැකියාව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර ණය අයකර ගත යුතුය.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුම් 3 කට අදාළව රු. 191,600,190 ක ශේෂයක් පැවතුණි. එම ශේෂය තුළ වසර 2 ත් 5 ත් අතර රු. 32,825,394 ක ශේෂයක් ද වසර 5 ත් 10 ත් අතර රු.27,031,903 ක ශේෂයක් ද වසර 10ට වැඩි රු.27,442,800 ක ශේෂයක් ද වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	තැන්පතු සඳහා මු.රෙ. 571(2) හා 571(3) පරිදි කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර තැන්පත් ගිණුම් නිරවුල් කළ යුතුය.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2024 දෙසැම්බර් 31 දිනට අවස්ථා 80 කට අදාළව හඳුනා නොගත් ලැබීම් රු.3,120,233 ක් වූ අතර එම ලැබීම් තුළ වසර 04 සිට මාස 01 දක්වා පැරණි ශේෂයන් පැවතිණි. තවද නිරවුල් නොවූ රු.737,500 ක ලැබීම් දෙකක් පැවති අතර ඒවා අවුරුදු 19 හා අවුරුදු 03 ඉක්ම වූ ලැබීම් විය.	දීර්ඝකාලයක සිට මෙම තැන්පතු හඳුනා ගැනීමකින් තොරව බැංකු සැසඳුම් හි දැක්වුණු බැවින් දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම පවතින යුනියන් පෙදෙස ශාඛාවේ සහයෝගය සහිතව ඒවා හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී.	හඳුනා නොගත් ලැබීම් කඩිනමින් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ප්‍රධාන කාර්යයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබූ දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගීතා සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීම අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම යන කාර්යය ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබූ අතර කිසිදු සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	පෙර වර්ෂයේදී මෙට්‍රික් ටොන් 8,000 ක සහල් සංචිතයක් පවත්වා ගැනීමට රුපියල් මිලියන 1,996 ක් ඉල්ලුම් කළද වෙන් කර ලබාදී ඇත්තේ රුපියල් මිලියන 100 ක් පමණි. එය ප්‍රමාණවත් නොවූ බැවින් අපේක්ෂිත සහල් සංචිතය පවත්වාගෙන ගොස් නොමැත.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකර අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හෝ ශුන්‍ය කිරීම හා රසායනික භාවිතය සඳහා වැය වන පිරිවැය අවම හෝ ශුන්‍ය කිරීම අරමුණු කරගෙන විද්‍යාත්මක ගබඩා ඉදිකර තිබුණ ද ලෝක ආහාර වැඩසටහන යටතේ ආධාර ලෙස ලැබී බෙදාහරින තුරු ගබඩාවන්හි ගබඩා කර පැවති ආහාර සඳහා 2024 වර්ෂයේ දී ධූමායන වාර 10 ක් සිදු කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.1,633,372 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා	එම ගබඩාවේ භාණ්ඩවල අයිතිය ලෝක ආහාර වැඩසටහනට හා ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාව සඳහා වූ හවුල්කාරීත්ව ලේකම් කාර්යාලයට වන හෙයින් ඔවුන්ගේ උපදෙස් හා නියෝග අනුව කටයුතු සිදු කරයි.	රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමේ අරමුණ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

	තිබුණි. ඒ අනුව රසායනික ද්‍රව්‍ය භාවිතය හා ඒ සඳහා වන පිරිවැය අවම කිරීම යන අරමුණ ඉටු වී නොතිබුණි.		
(ආ)	වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩා 03 ක උක්ත වැඩසටහන යටතේ ලද සහල්, පරිප්පු, රටඉඳි, එළවළු තෙල් යන ආහාර ද්‍රව්‍ය පාසල් දරුවන් හා අඩු ආදායම්ලාභී පවුල් වෙත ලබාදීම සඳහා ගබඩා කර පැවති අතර එම භාණ්ඩ ලැබුණු කාලය අනුව 2024 නොවැම්බර් 19 දිනට වර්ෂ 01 මාස 08 සිට මාස 08 දක්වා කාලයක් බෙදා හැරීමෙන් තොරව ගබඩා කර තබා ගැනීමෙන් භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුකර ගත නොහැකිව තිබුණි.	ලෝක ආහාර සංවිධානයේ සහ ලෝක ආහාර වැඩසටහනේ සහයෝගීතාව සඳහා වූ හවුල්කාරීත්ව ලේකම් කාර්යාලයේ උපදෙස් මත අදාළ කටයුතු සිදු කර ඇත.	ගබඩාවල ගබඩා කරන ද්‍රව්‍යන්ගේ තත්ත්වය වරින්වර පරීක්ෂා කළ යුතු අතර එවා නියමිත කාලය තුළ නියමිත පරිදි බෙදාහැරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

4.3 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද 2022 සහ 2023 වර්ෂවලට අදාළ වාර්ෂික කාර්යයසාධන වාර්තා 2025 අප්‍රේල් 30 දින වන විට ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	2022 හා 2023 වර්ෂ වලට අදාල කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යංශ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.	2022 හා 2023 වර්ෂයන්හි කාර්යසාධන වාර්තා කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 වර්ෂයේදී වේයන්ගොඩ අංක 06 දරන ගබඩාව රු.3,495,536 ක් වැය කර රසායනාගාරයකට පරිවර්තනය කර තිබුණ ද එම රසායනාගාරය වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවති අතර 2024 නොවැම්බර් 06 දින එහි පැවති රසායනාගාර උපකරණ වෙන්දේසි කර තිබිණි.	සාම්පල් පරීක්ෂා කිරීමේ කටයුතු වලට සෘජුවම යොදාගන්නා උපකරණ හැර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවති පැරණි උපකරණ පමණක් වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත.	රසායනාගාරය අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට සැලසුම් සහගතව කටයුතු කළ යුතුය.
(ආ)	වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පවතින පාලම් තරාදිය වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවති අතර අළුත්වැඩියා කර භාවිතා කිරීමට සැලසුම් කර නොතිබුණි. එහි උපාංග ඇතුළත් කාමරයේ වහලය ගැල වී තිබුණු අතර එහි උපාංගවල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජනයක් වී තිබුණි.	2025 අයවැය මගින් අනුමත කරන ලද ප්‍රතිපාදන මගින් අලුත්වැඩියා කිරීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ.	පාලම් තරාදිය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙනත් පාර්ශවයකට ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඇ)	නිවාස 366 කින් යුතු ධාන්‍යාගම නිවාස සංකීර්ණයට අයත් භූමිය පවරා නොගෙන වසර 43 ක් ගතවී ඇති අතර මෙහි මැනුම් කටයුතු 2021 ජූලි 07 දින සිදුකර වසර 03 කට අධික කාලයක් ද ගත වී තිබුණි. නිවාස සංකීර්ණයේ නිවාස 28 ක් වසර 01 සිට 14 දක්වා කාලයක් අබලන්ව පැවති අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	විගණනය හා එකඟ වේ. සංකීර්ණය අයත් භූමිය පවරා ගැනීමටත් අබලන් නිවාස අලුත්වැඩියාවටත් කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.	සංකීර්ණය අයත් භූමිය පවරා ගැනීමටත් අබලන්ව පවතින නිවාස අලුත්වැඩියාකර භාවිතයට ගැනීමටත් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආහාර මුද්දර, භූමිතෙල් මුද්දර, සහල්, පිටි, සීනි හා වෙනත් වශයෙන් සමුපකාර සමිති 156 කට ලබාදුන් ණය මුදල් වලින් 2024 දෙසැම්බර් 31 වන විට රු.154,855,604 ක ශේෂයක් අයවිය යුතුව පැවති අතර මූල්‍ය ප්‍රකාශන අනුව මෙම ණය මුදල් වසර 10 කට වඩා පැරණි ණය ශේෂ විය. මේ වන විට සමුපකාර සමිති එකකින් පමණක් වාරික මුදල් අය වෙමින් පවතින අතර අනෙකුත් සමිතිවල ණය	සමුපකාර සමිති වෙතින් මුදල් ගෙවීම නිසි පරිදි සිදු නොවන බව හා ඉදිරියේදී ණය මුදල් අයකර ගැනීමට අදාලව ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදී.	අයනොවන ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		
(ආ)	වසර 10 කට වැඩි කාලයක සිට අය නොවී පවතින ගබඩා භාරකරුවන් 225 දෙනෙකුගෙන් අයකර ගත යුතු අධිභාර වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු.45,721,968 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	අධිභාර අයකර නොගත් ගබඩා භාරකරුවන් අතරින් කිසිදු ලෙසකින් හෝ අයකර ගැනීමක් සිදු නොකළ හැකි භාරකරුවන්ගේ අධිභාර කපා හැරීම සඳහා කටයුතු සිදු කිරීමට සටහන් කර ගතිමි.	අධිභාර අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර නොගෙවන අධිභාර අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ලෝක ආහාර වැඩසටහන යටතේ ලැබී තිබුණු රටඉඳි තොගයක් නියමිත දිනට නිෂ්කාශනය කිරීමට නොහැකිවීම හේතුවෙන් රු.398,909 ක ප්‍රමාද ගාස්තුවක් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවිමට සිදු වී තිබුණි.	ප්‍රමාද ගාස්තුව නැවත අප වෙත ගෙවන ලෙස කරන ලද ඉල්ලීමට පිළිතුරු ලෙස වරාය අධිකාරිය වෙතින් දන්වා ඇත්තේ රු. 398,909 ක මුදල දණ්ඩනීය ගාස්තුවක් නොව අයකරන බිම් කුලියක් බවයි.	අදාල ගාස්තුව ගෙවීමට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන එම පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ලෝක ආහාර වැඩසටහන යටතේ ලැබී තිබුණු සහල් කිලෝග්‍රෑම් 297 ක්, පරිප්පු කිලෝග්‍රෑම් 3385 ක් හා එළවළු තෙල් කෑන් 152 ක් සත්ව ආහාර ලෙස සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබුණු අතර තවත් සහල් කිලෝග්‍රෑම් 40 ක්, පරිප්පු කිලෝග්‍රෑම් 600 ක් හා එළවළු තෙල් කෑන් 21 ක නශ්‍ය වීම් ලෙස හඳුනාගෙන තිබුණි.	පරිභෝජනයට සුදුසු තත්ත්වයක නොමැති ලෝක ආහාර වැඩසටහනට අයත් ආහාර ද්‍රව්‍ය සත්ව ආහාර ලෙස නිකුත් කිරීම හෝ විනාශ කිරීම සිදු කරන්නේද යන්න තීරණය කරනු ලබන්නේ ලෝක ආහාර වැඩසටහනේ මාර්ගෝපදේශ වලට අනුව වේ.	ආධාර වැඩසටහනේ අරමුණු අනුව ආහාර නියමිත දිනට පෙර බෙදා හැරීමට කටයුතු කළ යුතු වුවද එසේ නොකිරීම තුළින් නොසැලකිල්ල හේතුවෙන් අලාභ සිදුවී ඇත් ද යන්න පරික්ෂා කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ ගබඩා ගොඩනැඟිලි බාහිර පාර්ශවයන්ට බදුදීමේදී ගිවිසුම් ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ජලය, දුරකථන හා විදුලිය සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවිය යුතු වුවද ආයතන 08 ක් සම්බන්ධයෙන් මාස 50 සිට මාස 02 දක්වා කාල පරාසයකට අදාළව රු. 35,719,639 ක විදුලි බිල්පත් ද මාස 47 සිට මාස 02 දක්වා කාල පරාසයකට අදාලව රු.1,706,867 ක ජල බිල්පත් ද ලෙස එකතුව රු.37,426,506 ක් අයකර ගෙන නොතිබුණි.	ප්‍රතිපූර්ණය නොවූ බිල්පත් ඉක්මනින් ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා යැවීමට කටයුතු කරනු ලැබේ.	ගෙවා ඇති බිල්පත් වෙනුවෙන් ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	2018 ජූලි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පළතුරු, එළවළු, ඵෑණු සහ අනෙකුත් ආර්ථිකමය වශයෙන් වාසිදායක බෝගවල මිල උච්චාවචනය අවම කිරීම සඳහා මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයකින් යුතු උෂ්ණත්ව පාලක ගබඩා පහසුකමක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.		
(i)	2019 ජූනි 26 දින ආහාර කොමසාරිස්වරයා සහ කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව මාස 06 කින් අවසන් කළ යුතු ව්‍යාපෘතිය සඳහා අවුරුදු 5 කට අධික කාලයක් ගතකර තිබුණ ද 2025 අප්‍රේල් අවසන් වන විටත් වැඩ අවසන් කර භාරදී නොතිබුණි. එසේම ගබඩාවේ කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය සඳහා ආයතනයක් තෝරා ගැනීම වෙනුවෙන් 2024 ජූලි 28 හා 2024 අගෝස්තු 23 දෙදින තුළ පුවත්පත් 06 ක දැන්වීම් පළ කර රු.261,287 ක් ගෙවා තිබුණ ද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 30 දින වන විටත් ඒ සඳහා ආයතනයක් තෝරා ගෙන නොතිබුණි. තවද ගබඩා උපයෝජනයේදී නිකුත් කරනු ලබන මළ අප ජලය බැහැර කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් විගණිත දින වන විටත් සකස් කර නොතිබුණි.	අදාල ව්‍යාපෘතිය 2025 ජූනි 15 දින වන විට සම්පූර්ණ කර භාර දෙන බවටත් නැතහොත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බවටත් කොන්ත්‍රාත්කරු වෙත දන්වා යවා ඇත. ඉන්පසු ගබඩාවේ කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය සඳහා සුදුසු ආයතනයක් තෝරාගැනීමට කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘතිය නියමිත පරිදි භාර ගැනීමටත් කළමනාකරණය සඳහා සුදුසු ආයතනයක් කඩිනමින් තෝරා ගෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කළ යුතුය.
(ii)	මෙම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම භාවිතා කිරීමටත් එහි අයිතිය ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පැවරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වසර 06 ක පමණ කාලයක් ගත වී ඇතත් 2025 අප්‍රේල් 30 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාල ඉඩම පවරාගැනීම සඳහා 2024 දෙසැම්බර් මස රු. මිලියන 21.4 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම් කර ඇත. පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමි පවතී.	අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය.

(iii)	2022 ඔක්තෝබර් 22 දින පවත්වන ලද රජයේ ගිණුම්කාරක සභාව විසින් මෙම ගබඩා සංකීර්ණය සඳහා සූර්ය පැනල සවි කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස නිර්දේශ කර තිබුණ ද මේ වනවිට වසර 02 ක් ඉක්මවා තිබුණද ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සූර්ය පැනල සවිකිරීම සඳහා අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී.	රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශය පරිදි සූර්යපැනල සවි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
(iv)	මුළු ධාරිතාවය මෙ.ටො. 5000 කින් යුතු මෙම ගබඩාවේ ද්‍රව්‍ය වල බර මැනීම සඳහා වරකට මෙ.ටො. 02 ක් මැනිය හැකි බිම් තරාදි 06 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර ගබඩා ද්‍රව්‍ය ප්‍රධාන ගබඩාවට යොමුකිරීමට පෙර සිසිලන ඒකකයේ හා නිකුත් කිරීමට පෙර පශ්චාත් තාපන ඒකකයේ පැය 4-5 ක කාලයක් ඒවා තැබිය යුතු වුවද එම ඒකක 2 හි ධාරිතවය මෙ.ටො. 12 ක් පමණක් වීම හේතුවෙන් ගබඩාව සම්පූර්ණයෙන් පිරවීම සඳහා අවම වශයෙන් දින 83 ක පමණ දීර්ඝ කාලයක් ගත කිරීමට සිදුවන බව නිරීක්ෂණය වු අතර ඒ පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට සටහන් කර ගන්නා ලදී .	ගබඩාව හා ගබඩා ධාරිතාවය මෙන්ම කාලය පිළිබඳව අවධානය යොමු කරමින් වත්කම් නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අප්‍රේල් 29 දිනැති අංක අමප/20/0722/218/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විවෘත වෙළෙඳපල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම පිණිස වී තොග යොදා ගනිමින් සහල් නිපදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබාදීමේ වැඩසටහන මඟින් 2020 සිට 2024 දක්වා රු.මිලියන 423.7 ක ණය මුදලක් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	ගිවිසුමේ iii ඡේදය ප්‍රකාරව ණය මුදල ලබා ගත් දින සිට මාස 06 ක් ඉක්මවීමට ප්‍රථම ගෙවා නිම කිරීමට සමුපකාර සමිති විසින් එකඟ වී තිබුණ ද 2025 අප්‍රේල් අවසන් වන විට රු.මිලියන 301.387 ක ණය	මේ වන විට ගෙවා නොතිබෙන ශේෂය රු. මිලියන 301.387 ක් වේ.	ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට හෝ ණය මුදල් නොගෙවීම සම්බන්ධයෙන් ගිවිසුම් පරිදි ඉදිරි

	ශේෂ ගෙවා නිමකර නොතිබුණි. මෙහිදී ගිවිසුමේ 3 vii ඡේදය ප්‍රකාරව මසකට සියයට 1.5 බැගින් ප්‍රමාද ගාස්තු අයකර ගෙන ද නොතිබුණි.		පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ගිවිසුමේ 1 (ii) වගන්තිය ප්‍රකාරව රජයට ඇති ණය පියවීමට අදාළ සියලු නෛතික කටයුතු සිදු කිරීමට පළමු පාර්ශවය වන ආහාර කොමසාරිස්වරයා වගකීමෙන් බැඳී සිටිය ද අවුරුදු 03 මාස 07 සිට මාස 05 දක්වා කාලයක සිට නොගෙවා පවතින ඉහත ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් ණය අයකර ගැනීම සඳහා නෛතික කටයුතු කිරීමට බැඳී සිටින අතර ණය කඩිනමින් නිරවුල් කරන ලෙස එක් එක් සමිති සභාපතිවරුන් වෙත **FC/**09/02/11 සහ 2024 දෙසැම්බර් 30 දිනැති ලිපිය මඟින් ද දැනුවත් කර ඇත.	ගිවිසුම් ප්‍රකාරව ණය අයකර ගැනීමට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෝල් හිමියන්ට දෙන ණය, චක්‍රීය ණය ලෙස භාවිත කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණ ද එම ණය චක්‍රිය ණය ලෙස භාවිතා කර තිබීමෙන් ගිවිසුම් ප්‍රකාරව ණය ලබා දී මාස 06 ක් පිරුණු වහාම එම මුදල් මහා භාණ්ඩාගාරයට පියවීමට ක්‍රියාකර නොතිබුණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. 72,109,209 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	මුදල් අයකර ගැනීම සම්බන්ධව කාලසීමාවක් හෝ චක්‍රීය ලෙස භාවිතා කිරීම හෝ නොකිරීම සම්බන්ධ තොරතුරු කැබිනට් පත්‍රිකාව තුළ සඳහන් නොවන නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධ මාර්ගෝපදේශයන් සහ අදාළ ක්‍රමවේදයන් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කිරීම සිදුකළ යුතු බව දක්වා ඇති බැවින් ඒ අනුව එම මුදල් චක්‍රීය ලෙස භාවිතා කිරීමට කටයුතු කර ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතු අතර චක්‍රීය ණය මුදල් යෝජනා ක්‍රම පවත්වා ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය.
(ඇ)	2024 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 02 ක කාලසීමාවක් සඳහා ආපනශාලාව බදු දී තිබූ අතර මාස 3 ක ප්‍රමාදයකින් පසු 2024 අප්‍රේල් 01 දින බදුකරු වෙත ආපනශාලාව භාරදීම හේතුවෙන් එම මාස 03 සඳහා වූ රු.354,000 ක බදු කුලියක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. තවද ආපනශාලාව සඳහා 2024 අප්‍රේල් සිට 2024 ඔක්තෝබර් දක්වා මාස 07 සඳහා වූ (බදු සහිත) රු.995,330 ක කුලිය අයකර ගෙන නොතිබූ අතර ගිවිසුම ප්‍රකාරව හිඟ කුලී සඳහා අයකළ යුතු ප්‍රමාද ගාස්තුව ද ගණනය කර අයකරගෙන නොතිබුණි. තවද ගිවිසුමේ 9 වන වගන්තිය අනුව ආපනශාලා පරිශ්‍රයේ පරිභෝජනය කරන විදුලිය, දූරකථන සහ ජලය සඳහා වූ බිල්පත් බදුකරුගෙන් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	මීට පෙර ආපන ශාලාව පවත්වාගෙන ගිය බදුකරුගේ හිඟකුලී අයකර ගැනීමට එම ආයතනය සතු භාණ්ඩ වෙන්දේසි කිරීමට කාලයක් ගතවූ බැවින් නව බදුකරු වෙත භාරදුන් දින සිට බදුකුලී අයකිරීමට තීරණය කර ඇත. හිඟ කුලිය කඩිනමින් ගෙවන ලෙස බදු කරු වෙත දැනුම් දී ඇත.	හිඟ කුලී හා හිඟ බිල්පත් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	2024 ඔක්තෝම්බර් 31 දිනට ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ දැනට පදිංචි නිවාස 121 කින් හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන පවරා ගන්නා ලද නිවාස 10 ක පදිංචිකරුවන්ගෙන් එකතුව රු.3,493,567 ක නිවාස කුලියක් ද නීතිමය කටයුතු සිදු කරමින් පවතින නිවාස 23 ක පදිංචිකරුවන්ගෙන් 2024 ජූනි 30 දිනට රු.1,552,156 ක නිවාස කුලියක් ද අයකරගෙන නොතිබුණි.	හිඟකුලී කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.	හිඟ නිවාස කුලී කඩිනමින් අයකර ගැනීමටත් අවශ්‍ය අවස්ථාවල නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් කුලියට දී ඇති ගබඩා හා පරිශ්‍ර 32 ක් සඳහා පෞද්ගලික අංශයේ ආයතන 15 කින් රු.36,634,171 ක් ද, ගබඩා 21 ක් සඳහා රාජ්‍ය ආයතන 07 කින් රු.75,767,880 ක් ද, සන්තකය ලබා ගැනීම හා හිඟ ගබඩා කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගබඩා 04 ක් සම්බන්ධයෙන් ආයතන 04 කින් රු.30,751,840 ක් ද, කුලියට ලබා දී නැවත පවරාගෙන තිබුණු ගබඩා 27 ක් සම්බන්ධයෙන් රු.47,121,615 ක් ද වශයෙන් රු.190,275,506 ක හිඟ ගබඩා කුලී අයකරගෙන නොතිබුණි.	පුද්ගලික ආයතනවලින් රු.27,591,117 ක හිඟ මුදල් අය කිරීමට කටයුතු කර ඇත. රාජ්‍ය ආයතන වලින් හිඟ මුදල් අය කිරීම් කටයුතු කරමින් පවතී. සතොස ආයතනය වෙත හිඟ කුලී ගෙවන ලෙස 2025 අප්‍රේල් 22 දින දැනුම් දී ඇත.	හිඟ ගබඩා කුලී කඩිනමින් අයකර ගැනීමටත් අවශ්‍ය අවස්ථාවල නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
(උ)	පෞද්ගලික අංශය වෙත ගබඩා ගොඩනැඟිලි 03 ක් හා රාජ්‍ය අංශයේ ආයතන 02 කට ගබඩා 02 ක් ගිවිසුම් රහිතව කුලී පදනම මත ලබා දී තිබූ අතර රාජ්‍ය අංශයේ ආයතන 07 කට ධාරිතාව මෙට්‍රික් ටොන් 43,645 ක වර්ග අඩි 250701 ක් වූ ගබඩා 18 ක් කුලී අයකිරීමෙන් හා කිසිදු ගිවිසුමකින් තොරව ලබා දී තිබුණි.	සොයා බලා පිළිතුරක් ඉදිරිපත් කරන බව දන්වමි.	විධිමත් කුලී ගිවිසුම් මත ගබඩා ලබා දීමට හා නියමිත පරිදි කුලී අයකිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	2023 වර්ෂයේ ගබඩා හා නිවාස සඳහා අයවිය යුතු සමස්ථ හිඟ කුලිය රු.116,346,863 ක් වූ අතර 2024 වර්ෂයේ දී එය රු.196,946,397 ක් දක්වා රු.80,599,534 කින් ඉහල ගොස් තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව එහි වැඩිවීම සියයට 69 ක් වී තිබුණි.	2023 වර්ෂයේ ගබඩා හා නිවාස සඳහා අයවිය යුතු සමස්ථ හිඟ කුලිය රු. 14,818,351 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දින දක්වා එය රු.183,450,813 ක් වූ අතර එහි වෙනස රු.168,632,462 ක් විය. පැවති ආර්ථික අර්බුදය හා ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් ගෙවීම පැහැර හැරීම මෙම වැඩිවීමට හේතු විය. කඩිනමින් කුලී මුදල් ගෙවන ලෙස දැනුවත් කිරීම හා අවශ්‍ය නීතිමය පියවර ගැනීමටද කටයුතු කර ඇත.	අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(එ)	දෙපාර්තමේන්තුවට අයත් වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පිහිටි මෙට්‍රික් ටොන් 16,330 ක ධාරිතාවයෙන් යුත් ගබඩා 06 ක් 2025 අප්‍රේල් 30 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.	වී මිලදී ගැනීම සහ ආරක්ෂණ තොග තබා ගනිමින් සහල් මිල ස්ථායීව තබා ගැනීම සඳහා රජයේ නව වැඩපිළිවෙල අනුව මෙම ගබඩා භාවිතා කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත.	ගබඩාවල ධාරිතාවය උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කළ යුතුය.
(ඒ)	ධාරිතාවය මෙට්‍රික් ටොන් 16,920 ක් වූ වර්ග අඩි 78,000 ක ප්‍රමාණයේ භාවිතයට නුසුදුසු ගබඩා 04 ක් නවීකරණය කිරීමෙන් තොරව වසර 04 සිට 12 දක්වා කාලයක සිට පැවතුණි.	වී මිලදී ගැනීම සහ ආරක්ෂණ තොග තබා ගනිමින් සහල් මිල ස්ථායීව තබා ගැනීම සඳහා රජයේ නව වැඩපිළිවෙල අනුව මෙම ගබඩාවන් භාවිතා කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත.	ගබඩා භාවිතයට සුදුසුවන පරිදි නවීකරණය කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2024 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව මෙම දෙපාර්තමේන්තුව ඈවර කිරීමට තීරණය කර තිබූ හෙයින් මෙම තනතුර ඇති කිරීම පිළිබඳව වූ කටයුතු ද ආරම්භ කර නොතිබූ නමුත් තනතුර අනුමත කරගෙන ඉදිරි කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදී.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 208 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 53 ක් වූයෙන් 159 ක සේවක පුරප්පාඩු පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් ඒ සඳහා නිලධාරීන් ලබා දී නොමැත.	දෙපාර්තමේන්තුවේ කාර්යයන් බාධාවකින් තොරව ඉටුකිරීමට අත්‍යවශ්‍ය සේවක සංඛ්‍යාව කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.